*සැ. යු.*- 2019.09.06 දින පළ වූ අංක 2140 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,141 - 2019 සැප්තැම්බර් මස 12 වැනි බ්‍රහස්පතින්දා - 2019.09.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 1560 |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1561 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2019 අගෝස්තු මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ඔක්තෝබර් මස 04 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 සැප්තැම්බර් මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

## ආණ්ඩුකාරවර කාර්යාලය - වයඹ පළාත

### 1987 අංක 42 දරන පළාත් සභා පනතේ IV වන කොටසේ 32 (1) වගන්තිය යටතේ වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් කරන ලද පත්වීම්

| අනු අංකය | නම/සේවය/පන්තිය | පත් කරන ලද තනතුර/සේවා ස්ථානය/ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|
| 01 | අයි. එම්. අයි. ඉලංගකෝන් මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. I පන්තිය | 2018.08.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, නිත්‍ය තනතුරට අමතරව වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස් තනතුරේ වැඩ බැලීම සඳහා |
| 02 | අයි. එම්. අයි. ඉලංගකෝන් මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. I පන්තිය | 2018.10.04 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස් තනතුර සඳහා |
| 03 | කේ. එම්. එච්. එස්. කේ. ජයලත් මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. I පන්තිය | 2018.10.04 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුර සඳහා |
| 04 | එන්. එම්. ජේ. ප්‍රනාන්දු මිය<br>ශ්‍රී. ලං. ප. සේ. I පන්තිය | 2018.10.26 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා |
| 05 | නිලූකා කේ. ජයවර්ධන මිය<br>ශ්‍රී. ලං. ප. සේ. I පන්තිය | 2018.10.26 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කුඩා කර්මාන්ත පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා |
| 06 | ටී. බී. වික්‍රමසිංහ මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. විශේෂ පන්තිය | 2018.11.02 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පුහුණු) තනතුර සඳහා |
| 07 | ඩබ්. ඩී. කේ. වෙහැල්ල මිය<br>ශ්‍රී. ලං. ප. සේ. විශේෂ පන්තිය | 2018.11.12 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශ ලේකම් තනතුර සඳහා |
| 08 | ආර්. ඒ. එස්. ජයතිලක මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. විශේෂ පන්තිය | 2018.11.16 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) තනතුර සඳහා |
| 09 | නිලූකා කේ. ජයවර්ධන මිය<br>ශ්‍රී. ලං. ප. සේ. I පන්තිය | 2018.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ පළාත් පේෂකර්ම අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා |
| 10 | ආර්. එම්. එන්. ප්‍රේමසිරි මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. I පන්තිය | 2018.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස හා ළමාරක්ෂක සේවා පළාත් කොමසාරිස් තනතුර සඳහා |
| 11 | ඩී. එම්. කේ. සී. දිසානායක මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. I පන්තිය | 2018.12.26 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් තනතුර සඳහා |
| 12 | එම්. ඒ. බී. සී. ආලෝක බණ්ඩාර මහතා<br>ශ්‍රී. ලං. ප. සේ. I පන්තිය | 2018.12.26 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, වයඹ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පළාත් ඉඩම් කොමසාරිස් තනතුර සඳහා |
| 13 | යූ. එම්. බී. ජෙයන්තිලා මෙනවිය<br>ශ්‍රී. ලං. අ. ප. සේ. I පන්තිය | 2018.06.21 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, නිත්‍ය තනතුරට අමතරව නිකවැරටිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා |

එන්. පී. එම්. කාරියවසම්,
ආණ්ඩුකාරවර ලේකම්,
වයඹ පළාත,
කුරුණෑගල.

09-373

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016 (2019)

1.0 මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා මධ්‍යම පළාත තුළ පදිංචි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය මහනුවර නගරයේ දී පමණක් හෝ අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව, මහනුවර, මාතලේ හා නුවරඑළිය යන නගරයන්හි දී හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් තීරණය කරනු ලබන පරිදි පැවැත්වේ. එබැවින් විභාගයට පෙනී සිටීමට ඔබ අපේක්ෂා කරන නගරය හා ඊට අදාළ නගර අංකය පහත සඳහන් පරිදි අයදුම්පතෙහි සඳහන් කළ යුතුය.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මහනුවර | 01 |
| මාතලේ | 02 |
| නුවරඑළිය | 03 |

2.0 මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් දිස්ත්‍රික් ජනගහන අනුපාතය පදනමින් මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරාගනු ඇත. තෝරාගනු ලබන අයදුම්කරුවන් මධ්‍යම පළාතේ දුෂ්කර සේවා ස්ථානවල පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදු කෙරේ.

3.0 (අ) පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ පිරවීමට හෝ නොපිරවීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත බලය ඇත.

(ආ) මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1869/4 සහ 2014.06.30 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලටද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ඇ) පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 05 ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධරයෙකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(ඈ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

4.0 *වැටුප* .- අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III, II හා I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය (MN 2-2016 වැටුප් බණ්ඩය) රු. 28,940 - 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - 47,990 ක් වන අතර, එම වැටුප ඔබට හිමිවන්නේ 2020.01.01 දින සිට වේ. රු. 31,940/- ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස් වීම ද, රු. 35,790/- න් ඔබ්බට යාම සඳහා I වන ශ්‍රේණියට උසස් වීම ද ලබා ගත යුතුය.

5.0 මෙම තනතුර ස්ථිර ය. මෙම විභාගයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියට පත්වන නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණය අනුව නිර්ණය කරනු ලැබේ.

6.0 *සුදුසුකම්* :- මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) අයැදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය. තවද මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
(ආ) අයැදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(ඇ) අයැදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඩුවම් නොලැබූ අයකු විය යුතුය
(ඈ) සෑම අයැදුම්කරුවෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(ඉ) අයැදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2019.09.27 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.
(ඊ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් අයැදුම්පත් බාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ කර තිබිය යුතුය. සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන සහතික පමණක් පිළිගනු ලැබේ.

(1) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*සහ*

(2) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සියළුම විෂයයන්ගෙන් එකවර සමත් ව තිබීම.

*සටහන.*- විෂයය 04ක් සහිත වූ පැරණි විෂය නිර්දේශය යටතේ විෂයය 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

*සැ. යු* :- සෑම අයැදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2019.09.27 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

7.0 *(අ)* සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. මධ්‍යම පළාතට අයත් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව එම එක් එක් දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. පුරප්පාඩු සම්පූර්ණ කරනු ලබන ආකාරය පිළිබඳ අවසන් තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

i. මෙම පළාතේ යම් දිස්ත්‍රික්කයකට ඉහත පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා ඉල්ලුම් කරන ලද සුදුසුකම් සපුරාලන ලද අයැදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවලදී, එම පුරප්පාඩු සංඛ්‍යාව මධ්‍යම පළාතේ අනෙකුත් දිස්ත්‍රික්ක දෙක සඳහා එක් එක් දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදා හරිනු ඇත.

ii. මධ්‍යම පළාත තුළ පිරවීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව ස්වල්පයක් නම් එම හේතුව මත දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම අදාළ කර ගත නොහැකි වන විට කුසලතා අනුපිළිවෙලින් සුදුස්සන් තෝරනු ලැබේ.

iii. විභාගයේදී අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ.

*(ආ)* මධ්‍යම පළාතට අයත් දිස්ත්‍රික්කයකට අයත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම් :

මධ්‍යම පළාතට අයත් දිස්ත්‍රික්කයක පුරප්පාඩු සඳහා තෝරාගනු ලැබීමට නම් පහත සඳහන් කරුණු සපුරා තිබිය යුතුය.

i. විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කල යුතු අවසන් දිනයට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු/ඇය එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක් (03) වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටිය අයෙකු විය යුතුය.

***සටහන.***- ලිඛිත විභාගයෙන් තේරී පත්වන අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී හෝ විමසන ඕනෑම අවස්ථාවක ඉහත දිස්ත්‍රික්කයට අයත්වීම සනාථ කිරීම සඳහා,

(i) අවුරුදු තුනක (03) අඛණ්ඩ පදිංචිය තහවුරු කෙරෙන ඡන්ද හිමි නාමලේඛන තොරතුරු සනාථ කෙරෙන ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

8.0 පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3% ක් ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන ආබාධිත අයැදුම්කරුවන් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3% ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයන්ගේ ලකුණු මට්ටම විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% ක් වත් විය යුතුය. පත්වීමක් සඳහා තෝරා ගනු ලැබූ අපේක්ෂකයෙකු විශේෂ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන අතර, විශේෂඥ වෛද්‍ය වාර්තාවකින් තම ආබාධිත තත්වය හා එය අදාළ තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා බාධාවක් නොවන බව තහවුරු කළ යුතුය.

*සටහන.-* අයැදුම්පත්‍රයේ අදාළ පරිදි තමා ආබාධිත පුනරුත්ථාපන කොන්දේසි යටතේ අයැදුම් කරන බව සඳහන් කළයුතු අතර, ආබාධිත නොවන අයෙකු සාවද්‍ය ලෙස ආබාධිත යැයි සඳහන් නොකළ යුතුය.

9.0 *විභාග පරිපාටිය :*

(අ) විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | *ලකුණු* | *කාලය* |
|---|---|---|
| භාෂා හැකියාව | 100 යි | පැය 2 1/2 යි |
| අභියෝග්‍යතාව | 100 යි | පැය 1 යි |

*භාෂා හැකියාව.-* මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කීපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*අභියෝග්‍යතාව.-* මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

*සටහන :* (i) රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

(ii) සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන්ම නොපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

(ආ) මෙම විභාගය තරග විභාගයක් වුව ද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක් (40%) බැගින් අපේක්ෂකයන් විසින් ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක් (50%) අනිවාර්යයෙන්ම ලබා ගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්කිරීම් කරනු ලැබේ.

(ඇ) *විභාග ප්‍රතිඵලය.-* අයැදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කරනු ඇත.

10.0 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් .-* අයැදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාග යේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයැදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් සේවයේ යෙදී සිටියදී වුවද ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය හේතු නොදක්වා සේවයෙන් පහ කරනු ලැබේ.

11.0 *විභාග ගාස්තු .-* සෑම අපේක්ෂකයෙකුම විභාග ගාස්තුවක් මධ්‍යම පළාත් සභාවට ගෙවිය යුතු වේ. විභාග ගාස්තුව රු: 600/-කි. එම ගාස්තුව මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයැදුම්කරු නමින් මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන නිල් පැහැති කුවිතාන්සිය අයැදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ මධ්‍යම පළාත් සභා ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන ලෙසය. ගෙවනු ලබන විභාග ගාස්තුව කවර හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. මුදල් ගෙවා ලබාගන්නා රිසිට්පතේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු වේ.

12.0 *අයැදුම්පත්‍ර* :- ඒ 4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපසම භාවිතා කරමින්,

(අ) අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවට ද,
(ආ) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ඇතුළත් වන සේ අයැදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය ;
(ඇ) අයැදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය ;
(ඈ) අයදුම්පත්‍රයේ 1.1 යටතේ අයැදුම්කරුගේ නම සඳහන් කිරීමේ දී අයැදුම්කරුගේ සම්පූර්ණ නමෙහි අගටම යෙදෙන කොටස පළමුව ලියා, පෙළපත් නාමයට අදාළ නම්වල මුලකුරු හා නමෙහි අනෙකුත් කොටස්වල මුලකුරු ඊළඟට වන සේ ලිවිය යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරැදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයැදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයැදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයැදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයැදුම්පත්‍රයට අනුකූලද යන්න පැහැදිලිව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුවහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප විය හැක. අයදුම්පත් ලද බව දන්වනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයැදුම්පත් හා අසම්පූර්ණ අයැදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගතවන අයැදුම්පත් සම්බන්ධයෙන්ද මෙම කොමිෂන් සභාව වගකියනු නොලැබේ.

*සැ. යු.*- තෝරාගන්නා අයැදුම්කරුවන් වෙත පත්වීම් නිකුත් කරනු ලබන්නේ අයැදුම්පත්‍රයේ සටහන් කරනු ලබන මුලකුරු සමග නමට පමණක් වන බැවින් අයැදුම්පත්‍රයේ සඳහන් ආදර්ශය අනුගමනය කරමින් නම නිවැරදිව සඳහන් කළ යුතු ය. පත්වීම් නිකුත් කරනු ලබන අවස්ථාවේ නමෙහි සංශෝධනයන් කිරීමට හෝ යම් කොටස් ඇතුළත් කිරීමට/ ඉවත් කිරීමට හෝ ඉඩ දෙනු නොලැබේ.

12.1 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයැදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයැදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩ දෙනු ලැබේ. ***තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ*** *පත්‍රයක් නිකුත් කිරීම විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට හා අයැදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.* අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12.2 අයැදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ **"මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019''** යන්න සහ *ඔබ පදිංචි දිස්ත්‍රික්කය* ද සඳහන් කරන්න.

12.3 සම්පූර්ණ කරන ලද අයැදුම්පත්‍රය 2019.09.27 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

13.0 *විභාගයට පෙනී සිටීම*.- අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ සඳහන් කරමින් නිවේදනයක් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දන්වා සිටිය යුතුය. එහිදී ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයැදුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව විභාගයේ නම, අයැදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය සඳහන් කරමින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගෙන් විමසන ලෙස දන්වන අතර, ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද හා ඉහත ඔබගේ විස්තර ඇතුළත් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම ද වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත.

විභාගයට පෙනී සිටින සෑම අයැදුම්කරුවෙකුම ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගතයුතු අතර තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතුය. එසේ පෙනී සිටින පළමු අවස්ථාවේදීම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළයුතුය. එසේ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයැදුම්කරුවෙකුට විභාග යට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ශ්‍රේණිගත කිරීමට අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රජයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

14.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය :-

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු රියදුරු බලපත්‍රය.

15.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට ද විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

17.0 මෙම දැන්වීම හා විභාග අයදුම්පත්‍ර මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk මගින් බාගත කළ හැකිය.

18.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළයුතුය.

එම්. ජී. ඒ. තිලකරත්න
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 සැප්තැම්බර් මස 09 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244,
කටුගස්තොට පාර,
මහනුවර.
ෆැක්ස් අංකය - 081-2213082.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**ආදර්ශ අයදුම්පත්‍රය**

මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016 (2019)

The Open Competitive Examination for the Recruitment of Grade III of Central Provincial Management Assistant Service of Central Province - 2016 (2019)

(දෙන ලද කොටු තුළ නිවැරදි සංකේතය/අංකය පැහැදිලිව සටහන් කරන්න.)

*විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය*

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

*විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය හා නගර අංකය*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| | |

ඔබ විභාගයට පෙනී සිටින්නේ *ගැසට්* නිවේදනයේ 8.0 ඡේදයේ ප්‍රකාරව, ආබාධිත පුනරුත්ථාපන කොන්දේසි යටතේ ද? (මෙම කොටසේ "ඔව්" ලෙස සඳහන් කළ යුත්තේ ආබාධිත අයැදුම්කරුවන් පමණක් බැවින් පිරවීමට පෙර *ගැසට්* නිවේදනයේ 11.0 ඡේදය හොඳින් කියවන්නේ නම් මැනවි.)

ඔව් - 1
නැත - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :- ....................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA A. B.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ....................
....................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : ....................
....................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ....................
....................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ....................
....................

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ....................
....................

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය -

පුරුෂ - 1 ස්ත්‍රී - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

3.3 අයැදුම්පත් කැඳවන අවසන් දිනට වයස :

අවුරුදු : මාස : දින :

3.4 දුරකථන අංකය :

ජංගම :

ස්ථාවර :

4.0 4.1 අයැදුම්කරු දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද? : ....................
4.2 උප දිසාපති/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ....................
4.3 මධ්‍යම පළාත තුළ පදිංචිව සිටින කාලසීමාව : ....................
4.4 ග්‍රාම නිලධාරි කොට්ඨාසය : ....................

5.0 අධ්‍යාපන සුදුසුකම් : (ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන ප්‍රතිඵල සහතිකය ප්‍රකාරව පහත විස්තර සම්පූර්ණ කළ යුතුය.)

5.1 අ. පො. ස. (සා. පෙළ) විභාග ප්‍රතිඵල පිළිබඳ විස්තර :

(සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය)

| විභාගයේ වර්ෂය : | | | | | |
|---|---|---|---|---|---|
| විභාග අංකය : | | | | | |
| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
| 1 | භාෂාව (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි) | | 6 | | |
| 2 | ගණිතය | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

5.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය ප්‍රතිඵල පිළිබඳ විස්තර :

(අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සියළුම විෂයයන්ගෙන් එකවර සමත් ව තිබිය යුතුය)

| විභාගයේ වර්ෂය : | | |
|---|---|---|
| විභාග අංකය : | | |
| | *විෂයය* | *සාමාර්ථය* |
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| 5 | සාමාන්‍ය ඉංග්‍රීසි | |

5.3 පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා ඇත්නම්,

(I) විශ්ව විද්‍යාලය :- ..............................

(II) උපාධිය :- ..............................

(III) විභාග වර්ෂය :- ..............................

6.0 වෙනත් සුදුසුකම් :- ..............................

..............................

7.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (√ ) ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

| ඔව් | නැත |
|---|---|

..............................

..............................

..............................

8.0 විභාග ගාස්තු ගෙවූ රිසිට්පත පිළිබඳ විස්තර : (අයැදුම්කරු නමින් මුදල් ගෙවා තිබිය යුතුය.)

(I) විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ..........................................................................................................

(II) ලදුපත් අංකය හා දිනය : ..........................................................................................................

(III) ගෙවූ මුදල : ..........................................................................................................

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) |

9.0 *අයැදුම්කරුගේ සහතිකය :*

මෙම අයදුම්පතේ ම විසින් සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. තවද මෙම විභාගයේ නීතිරීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත් මෙම විභාග කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයන් පිළිගැනීමට මා එකඟ වෙමි.

දිනය : ......................

............................................... ;
අයැදුම්කරුගේ අත්සන.

10.0 *අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන ..........................................................................................................මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ..................................... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් සහතික කරමි.

දිනය : ......................

............................................... ;
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ නම : ..........................................................................................
තනතුර : ..........................................................................................
ලිපිනය : ..........................................................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

09-803

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.